**අපි වෙනුවෙන් අපි අරමුදල - 2021**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

අපි වෙනුවෙන් අපි අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ *සහ* 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ප්‍රත්‍යාගණන වටිනාකම රු. 4,952,742 ක් වූ ගොඩනැඟිලි ඉදිකිරීම් යන්ත්‍ර හා උපකරණ 2018 වර්ෂයේ සිට අරමුදලේ ඉදිකිරීම් කටයුතු සඳහා උපයෝජනය කර ගැනීමකින් තොරව ශ්‍රී ලංකා යුධ හමුදාවට සහ ශ්‍රී ලංකා නාවික හමුදාවට භාරදී තිබුණි. එසේ වුවත් භෞතිකව අරමුදල සතුව නොමැති මෙම වත්කම් ඉහත ආයතන වෙත පවරාදීමට කටයුතු නොකර වත්කම් භාවිතයේ පවත්නා බව සලකා ක්ෂය වියදමද හඳුනාගෙන තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය සඳහා හඳුනාගෙන තිබුණු ක්ෂය වියදම රු. 2,532,065 ක් විය. | අරමුදල විසින් අරමුදල් පමණක් නොව පූර්ණ නිවාස ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 4 වන ශ්‍රීලංකා ඉංජිනේරු රෙජිමේන්තුව භාරයේ ඇති ස්ථාවර වත්කම් උපයෝජනය කරගන්නා අතර ශ්‍රමය අවශ්‍ය පුද්ගලයින් හට රෙජිමේන්තු හරහා ශ්‍රමයද ලබාදෙයි. එවන් අවස්ථාවන්හිදී ඉදිකිරීම් සඳහා අවශ්‍ය යන්ත්‍ර හා සුළු උපකරණ 4 වන ශ්‍රීලංකා ඉංජිනේරු රෙජිමේන්තුව මගින් ලබාදෙයි. | අභාවිත වත්කම් පවරාදීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළයුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අරමුදල විසින් ක්‍රියාත්මක කරනු ලබන අර්ධ හා පූර්ණ නිවාස ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ප්‍රතිලාභීන් වෙත සිදුකරනු ලබන වාරික ගෙවීම. | 120,441,658 | එම මුදල් අදාල කාලසීමාව තුළ අරමුදල විසින් තෝරාගත් ප්‍රතිලාභීන් 426 ක් වෙත ලැබුණු බවට සනාථ වන ලියවිලි. | ප්‍රතිලාභීන් සඳහා හිමි ප්‍රතිලාභ මුදල් ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය වෙත ලබාදෙනු ලබන අතර, එසේ එක් එක් ප්‍රතිලාභියා වෙත ලබාදෙනු ලබන ප්‍රතිලාභ මුදල් අදාල අයට ගෙවූ බව සනාථ කරන ලියවිලි පවත්වා ගන්නා ලෙස ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය වෙත උපදෙස් දී ඇත. | ගෙවනු ලබන මුදල් අදාල ප්‍රතිලාභීන් වෙත ලැබුණු බවට තහවුරු කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රණජයපුර නිවාස ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට හිඟහිටි මුළු වාරික වටිනාකමෙන් සියයට 57 ක් හෙවත් රු. 21,267,000 ක් වසරකට වැඩි කාලයක සිට හිඟ හිට පැවතුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය තුළදී නිවාසලාභීන් 47 ක ගෙන් වර්ෂයට අදාල කිසිදු වාරික මුදලක් අයකර ගැනීමට අපොහෙසත්ව තිබුණි. | රණජයපුර නිවාස ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිවාස ලාභීන්ගෙන් අයවියයුතු හිඟ වාරික මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ත්‍රිවිධ හමුදාවන්ගේ අදාළ අංශ වෙත ලිපි මගින් දැනුම් දී ඇති අතර, ඉදිරියේදී එම හිඟ වාරික කඩිනමින් අයකර ගැනීමට කටයුතු සිදු කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (2) (ඇ) හා මාර්ගෝපදේශ 04 | එක් එක් කාර්තුව අවසානයේ අරමුදලේ ප්‍රගතිය සමාලෝචනය කළ හැකි වන පරිදි අරමුදලේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ කාර්තුමය වාර්තාවක් සකස් කර කාර්තුව අවසන් වී දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද 2021 වර්ෂය සඳහා එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණනය විසින් ලබා දී ඇති උපදෙස් පරිදි ඉදිරි කාර්තුමය වාර්තා සකස් කර කාර්තුව අවසන් වී දින 15 කට පෙර එම වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව බව දන්වමි. | අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (2) (ඇ) හා මාර්ගෝපදේශ 04 ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (2) (ඇ) වගන්තිය | අරමුදල විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විගණනය විසින් ලබා දී ඇති උපදෙස් පරිදි අරමුදල විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග කාර්ය සාධන වාර්තාවක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරන බව දන්වමි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (2) (ඇ) වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 හා රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (1) (ඇ) | අරමුදලක පාලක අධිකාරිය විසින් වාර්ෂික අයවැය ලේඛණය අරමුදලේ අරමුණට අනුකූලව පිලියෙලකර නිශ්චිත අනුමැතියන් සහිතව සැප්තැම්බර් 30 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත්කලයුතු වෙතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා අයවැය ලේඛණයක් සකස්කර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති අතර, මුරෙ 877(1)(ඇ) වගන්තිය ප්‍රකාරව අයවැය ලේඛනය මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිවර්ෂයේ සිට කටයුතු කරමින් පවතී. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 හා රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (1) (ඇ) ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**1.8 මුදල් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල විසින් පවත්වාගෙන යනු ලබන අරමුදල් කළමනාකරණ ඉතිරිකිරීමේ ගිණුමෙහි 2021 වර්ෂය තුල රු. මිලියන14.5 සිට රු. මිලියන 60.9 දක්වා පරාසයක පැවති ශේෂයක් පවත්වාගෙන තිබුණු අතර අතිරික්ත අරමුදල් සුදුසු කෙටිකාලීන ආයෝජනවල යෙදවීමට කටයුතු කර නොතිබුණි. | නිවාස ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් වෙත විවිධ අවස්ථාවන්හිදී ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා රදවා ගන්නා ලදි. ඒ අනුව ඒ ඒ අවස්ථාවන්හිදී ගෙවීමට අවශ්‍යවන ප්‍රමාණවත් මුදලක් පමණක් ගිණුම තුල පවත්වාගෙන යනු ලැබේ. | අරමුදලේ සැලසුම්ගත කාර්යයන් සඳහා අවශ්‍යතාව පුරෝකථනයකර අතිරික්ත අරමුදල් ආයෝජනය සඳහා සැලැස්මක් සකස්කල යුතුය. |
| (ආ) | අරමුදල විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක 2021 වර්ෂයේ සාමාන්‍ය මාසික ලැබීම් රු.51,434 ක් ද සාමාන්‍ය මාසික ගෙවීම් රු.13,434 ක් ද වුවත් රුපියල් මිලියන 2.1 ක සාමාන්‍ය මාසික ශේෂයක් සමාලෝචිත වර්ෂය තුළ පවත්වාගෙන ගොස් තිබුණි. | මෙම ගිණුමෙන්, රණජයපුර සාප්පු සංකීර්ණයේ ජල හා විදුලි බිල්පත් ගෙවීමත් තැන්පත් මුදල නිරවුල් කිරීමත් අළුත්වැඩියාකටයුතු ආදිය සිදුකරනු ලබයි. එබැවින් එම ගිණුමේ මුදල් කෙටිකාලීන ආයෝජනවල යෙදවීමට අවස්ථාව නොලැබුනි. | මුදල් අවශ්‍යතාව පුරෝකථනය කර අතිරික්ත අරමුදල් ආයෝජනය සඳහා කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 26,231,498 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.49,050,324 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 75,281,822 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ව්‍යාපෘති සංවර්ධන වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල විසින් අර්ධ නිවාස ආධාර ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී නිවාස 299 ක් සඳහා රු.209,742,767 ක ආධාර මුදලක් වාරික 03 ක් යටතේ ගෙවීමට සැළසුම් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී නිවාස 02 ක් සඳහා පළමුවන වාරිකය ලෙස රු.448,833 ක් පමණක් ගෙවා තිබුණු අතර කිසිදු නිවසක් සඳහා දෙවන හා තුන්වන වාරිකය ගෙවා නොතිබුණි. එබැවින් වාර්ෂික සැළසුම් අනුව අපේක්ෂිත මූල්‍ය කාර්යසාධනය හා භෞතික කාර්යසාධනය ඉතා අවම මට්ටමක පැවතුණි. | 2020 වර්ෂය තුල ක්‍රියාත්මක අර්ධ නිවාස ව්‍යාපෘතිය ව කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් 2021 වසරේ අවසන් කාර්තුව තෙක් පැවතුණු බැවින් 2021 වසරට අදාළ නිවාස ව්‍යාපෘතියෙහි කටයුතු දුෂ්කරතා මධ්‍යයේ සිදු කළ බැවින් වසර තුළ කිසිදු නිවසක් සඳහා දෙවන හා තුන්වන වාරිකය ගෙවා නොතිබුණි. එබැවින් අපේක්ෂිත කාර්යසාධන මට්ටමට එළඹීමට නොහැකි වූ අතර, මෙම තත්වය ව්‍යාපෘතියේ අකාර්යක්ෂමතාවයක් නොවන බව පෙන්වා දෙමි. | අපේක්ෂිත මූල්‍ය හා භෞතික කාර්යසාධන මටටම ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | පූර්ණ නිවාස වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේදී නිවාස 27 ක් සඳහා වාරික 3කදී රු.43,065,000 ක ආධාර ලබා දීමට සැළසුම් කළද වර්ෂය තුළ එක් නිවසක් සඳහා වාරික 03 ක්ද , නිවාස 02 ක් සඳහා වාරික 02 ක්ද, එක් නිවසක් සඳහා එක් වාරිකයක්ද බැගින් රු.3,985,000 ක් පමණක් ගෙවා තිබුණි. එය වර්ෂය තුළ ගෙවීමට සැලසුම්කල මුදලේ ප්‍රතිශතයක් ලෙස ගත්විට සියයට 9 ක් වැනි ඉතා අඩු මට්ටමක පැවතුණි. | 2020 වර්ෂයේ නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක වීම මත ගොඩනැගිලි ද්‍රව්‍ය හා අවශ්‍ය ශ්‍රමය ලබා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් ඉදිකිරීම් නියමිත කාලයතුළ අවසන් කිරිමට නොහැකි විය. ඒ අනුව එම නිවාස ව්‍යාපෘතිය 2021 වර්ෂයේද ක්‍රියාත්මක කිරිමට සිදු වූ බැවින් 2021 වසරට අදාල අපේක්ෂිත කාර්ය සාධන මට්ටමට එළඹීමට නොහැකි වූ අතර, මෙම තත්වය ව්‍යාපෘතියේ අකාර්යක්ෂමතාවයක් නොවන බව පෙන්වා දෙමි. | සැළසුම් කළ පරිදි ප්‍රතිලාභ ගෙවීම තුලින් අපේක්ෂිත කාර්ය සාධන මට්ටමට ලඟාකර ගැනීමට කටයුතුකළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(6) වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව අරමුදල ආරම්භයේ සිට 2020 වර්ෂය දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණනය විසින් ලබා දී ඇති උපදෙස් පරිදි ඉදිරි ගිණුම් වර්ෂයේදි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(6) වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 877 (2) (ඇ) හි සඳහන් මාර්ගෝපදේශ අංක 04 හි 7 ජේදය ප්‍රකාරව 2021 වර්ෂය සඳහා අනුමත අයවැය සීමාවන් හා සත්‍ය සීමාවන් සැසඳීම්කර විචලනයන් සඳහා හේතු ද සමග අයවැය සැසඳුම් ලේඛනය ගිණුම් සමග ඉදිරිපත් කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා අනුමත අයවැය ලේඛනය මින් පෙර විගණනය වෙත ඉදිරිපත් කර ඇති අතර, විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි මු.රෙ.877 විධිවිධාන ප්‍රකාරව මින් ඉදිරියට අනුමත සීමාවන් හා සත්‍ය සීමාවන් සැසඳීම්කර විචලනයන් සඳහා හේතුද සමඟ අයවැය සැසඳුම් ලේඛනයක් ඉදිරි විගණන වර්ෂයේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 877 (2) (ඇ) හි සඳහන් මාර්ගෝපදේශ අංක 04 හි 7 ජේදය ප්‍රකාරව කටයුතු කල යුතුය. |